2016 - අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල සටහනට අදාල සංකේත මගින් හැඳින්වෙන තොරතුරු පහත පරිදිය.

A විශිෂ්ඨ සාමාර්ථය
B අධි සම්මාන සාමාර්ථය
C සම්මාන සාමාර්ථය
S සාමාන්‍ය සාමාර්ථය
F අසමාර්ථතාව
\+ නොපැමිණියේය
X තීරණය කර නැත
N අදාල විෂයයේ ප්‍රතිඵල අවලංගු කර ඇත
H අදාල විෂයයේ ප්‍රතිඵල අත්හිටුවා ඇත

ඔබගේ ප්‍රතිඵලය අත්හිටුවා ඇත්නම් විමර්ශන ශාඛාවේ පහත සඳහන් දුරකථන අංකයට අමතා වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

දුරකථන අංකය : **011 - 2786214**

- අධ්‍යාපන ලේකම්ගේ අංක ෑ 2009/16 දරන චක්‍රලේඛය අනුව අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ප්‍රධාන විෂය ධාරාවන් හතරකි.

1. ජෛවීය විද්‍යා විෂය ධාරාව
2. භෞතීය විද්‍යා විෂය ධාරාව
3. වාණිජ්‍ය විෂය ධාරාව
4. කලා විෂය ධාරාව

ඉහත චක්‍රලේඛයට අතිරේකව ED/08/01/01/19 දරන 2015.11.19 දිනැති ලිපියට අනුව තාක්ෂණවේදය විෂයධාරාව ප්‍රධාන විෂය ක්ෂේත්‍ර දෙකක් යටතේ දක්වා ඇත.

I. ඉංජිනේරු තාක්ෂණවේදය
II. ජෛව පද්ධති තාක්ෂණවේදය

උක්ත නියමයන්ට අනුව එක් එක් විෂය ධාරාවට අයත් වන්නා වූ විෂය සංකලන සඳහන්ව ඇති අතර, අ.පො.ස.(උ.පෙළ) - 2016 විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී දිස්ත්‍රික් හා දිවයින් තරාව ගණනය කර ඇත්තේ එම එක් එක් විෂය ධාරාවන්ට වෙන් වෙන් වන ලෙසිනි.

උක්ත කිසිදු විෂය ධාරාවකට අයත් නොවන විෂය සංකලනයක් තෝරා ගන්නා ලද අපේක්ෂකයෙක් අදාළ චක්‍රලේඛයේම සඳහන් කර ඇති පරිදි "වෙනත් විෂය ධාරාව" යටතේ ප්‍රතිඵල නිකුත් කර ඇත. ඔවුන්ගේ දිස්ත්‍රික් හා දිවයින් තරාව ගණනය කොට ඇත්තේ එම කණ්ඩායමට පමණක් සීමා වන පරිදි වේ.

පසුගිය අ.පො.ස.(උ.පෙළ) විභාගවලදී උක්ත චක්‍රලේකයට අනුව වෙනත් විෂය ධාරාව යටතේ වර්ග කර තිබූ ඇතැම් අපේක්ෂකයන් තමා කලා විෂය ධාරාවට අයත් බවට වැරදියට වටහාගෙන කලා විෂය ධාරාවේ තරාකිරීම් සමඟ සංසන්දනය කිරීම නිසා ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණ දුනි. එම නිසා යම් අපේක්ෂකයෙක් ප්‍රතිඵල පරීක්ෂා කිරීමේදී තමාගේ විෂය ධාරාව නිවැරදිව හඳුනා ගත යුතු බව අවධාරණය කෙරේ.

**උදාහරණ ලෙස,**

කමල් කලා විෂය ධාරාවට අයත් අපේක්ෂකයෙකි. ඔහු A සාමාර්ථය 2ක් සහ B සාමාර්ථයක් ලබා ඇත. ඔහුගේ දිස්ත්‍රික් තරාව 258 හා දිවයින් තරාව 1573 විය.

නිමල් සිංහල, බෞද්ධ ශිෂ්ටාචාරය හා පෙරදිග සංගීතය යන විෂයයන්ට පෙනී සිටි අතර, උක්ත චක්‍රලේඛයට අනුව ඔහු අයත් වන්නේ වෙනත් විෂය ධාරාව යටතේ ය. ඔහු C සාමාර්ථය 3ක් ලබා තිබුණ ද, ඔහුගේ දිස්ත්‍රික් තරාව 13 ද, දිවයින් තරාව 128 ද විය. ඒ අනුව කමල් හා නිමල් එකම දිස්ත්‍රික්කයේ වුව ද එකම විෂය ධාරාවකට අයත් නොවන බැවින්, ඔවුන්ගේ දිවයින් හා දිස්ත්‍රික් තරාවන් සංසන්දනය කළ නොහැකිය.

- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාතික අධ්‍යාපන පීඨවලට සිසුන් ඇතුළත් කිරීමේදී උසස් පෙළ ප්‍රධාන විෂයයන් දෙකක් සමත් වීම සලකා බලන අවස්ථා පවත්නා බැවින් අවම වශයෙන් ප්‍රධාන විෂයන් දෙකක් සමත් අපේක්ෂකයින්ගේ Z ලකුණු ගණනය කර ඇත.